# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,493 - 2026 ජූනි මස 12 සිකුරාදා - 2026.06.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 880 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 884 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද අ◌ාඥාපනත යටතේ දැන්වීම් ... ... | 886 |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 889 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 03 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූනි මස 19 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

879 - B 082801— (2026/06)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## උකුවෙල ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවා ගණයේ ආයතනගත තනතුරු පුරප්පාඩු පිරවීම

1. උකුවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට උකුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. පුරප්පාඩු පවතින තනතුරු

| අනු. අංකය | තනතුරු | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය |
|---|---|---|---|
| 01 | බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු (කොන්ත්‍රාත් පදනම) | 01 | දෛනික වැටුප් ගෙවීමේ පදනම මත |
| 02 | කාර්යාල කාර්ය සහායක | 02 | දෛනික වැටුප් ගෙවීමේ පදනම මත |
| 03 | සෞඛ්‍ය කම්කරු | 01 | දෛනික වැටුප් ගෙවීමේ පදනම මත |
| 04 | මාර්ග කම්කරු | 01 | දෛනික වැටුප් ගෙවීමේ පදනම මත |

3. උක්ත තනතුරු සඳහා අවශ්‍ය පොදු සුදුසුකම් :

1.1 **අධ්‍යාපන සුදුසුකම්.-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් ව තිබීම, මින් විෂයයන් 05ක් එක වසරකදී සමත් වී තිබිය යුතුයි.

1.2 **කායික සුදුසුකම් .-**

සෑම අපේක්ෂකයෙකුම මනා සේ පෙනීමක් හා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර බල ප්‍රදේශයේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

1.3 **වෙනත් :**

i. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

ii. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් - එය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන්කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18-45 ක් අතර විය යුතුය. (අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

**බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම්;**

v. තාර බර හොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම.

vi. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද 'ඒ' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.

vii. එය බඳවා ගන්නා දිනට අවම වශයෙන් වසර 03 කට පෙර ලබා ගත් එකක් විය යුතුය.

viii. ඉහත බලපත්‍රයට අතිරේකව තනතුරට අදාළවන යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව රජය පිළිගත් ආයතනයකින් (NAITA/ICTAD) පුහුණුව ලැබූ බවට (NVQ 4 මට්ටමට නොඅඩු) සනාථ කරන සහතිකය.

ix. ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

x. පෙර සේවය කර ඇත්නම් එම ආයතන මගින් ලබා ගත් සහතික.

**සටහන.-** පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස පළමුව අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනීම කළ යුතුය. අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමානව තෝරා ගැනීමට සුදුස්සන් ප්‍රමාණවත් නොවූ විටෙක යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවීම කළ හැකිය.

4. බඳවා ගැනීමේ ක්‍රමය :

4.1 බඳවා ගන්නා ප්‍රතිශතය :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නොවේ. |
| කුසලතා | අදාළ නොවේ. |

4.2 බඳවා ගැනීමේ ක්‍රමය .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පවතින පුරප්පාඩුවලට පත් කරනු ලැබේ.

4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය .- සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය (100%)* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ. ඉහළම ලකුණු ලබාගත් ඉල්ලුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරාගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණුවල එකතුව | 100 | |

(පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ දී අදාළ පළාත් පාලන ආයතනයේ දැනට සේවයේ නියුතු අය සම්බන්ධයෙන් ප්‍රමුඛතාවයක් දිය හැක.)

5. වෙනත් පොදු සුදුසුකම් :

5.1 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

5.2 රජයේ/පළාත් පාලන/සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙක් හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.

6. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

6.1 අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2026.06.25 වැනි දිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, උකුවෙල " යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

6.2 අයදුම්පත් බහාලනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

6.3 අයදුම්පත්‍රයේ අයදුම්කරුවන් අත්සන සහතික කිරීම සාමදාන විනිශ්චයකාරවරයෙකු/ග්‍රාම නිලධාරියෙකු, මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

6.4 අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

- උප්පැන්න සහතිකය
- අධ්‍යාපන සහතිකය
- ජාතික හැඳුනුම්පත
- පදිංචිය සනාථ කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය
- මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (ඉන් 01 ක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.)
- වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන සහතික
- සේවා සහතිකය
- බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද "ජ" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයේ ඡායා පිටපතක්

6.5 අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කරන සහතිකවල මුල් පිටපත් පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු වේ.

**සැළකිය යුතුයි :**

දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ මත එවිය යුතුය.
(මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.)

බී. එම්. එම්. බාලසූරිය,
ලේකම්,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

**ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ආයතනගත තනතුරු සඳහා බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය**

01. සම්පූර්ණ නම :..........................................................................................................

02. ස්ථිර ලිපිනය :..........................................................................................................

03. උපන්දිනය :..........................................................................................................

04. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................

05. තනතුර :..........................................................................................................

06. දුරකථන අංකය :..........................................................................................................

07. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................................................................

08. අධ්‍යාපන සුදුසුකම් :..........................................................................................................

➢ අ.පො.ස. (සා.පෙළ) විභාගය :

පළමුවර

| විෂයය | සාමාර්ථය | සංකේත අංකය |
|---|---|---|
| | | |

දෙවනවර

| විෂයය | සාමාර්ථය | සංකේත අංකය |
|---|---|---|
| | | |

- අ.පො.ස. (උ.පෙළ) විභාගය :

| *විෂයය* | *සාමාර්ථය* | *සංකේත අංකය* |
|---|---|---|
| | | |

09. වෙනත් සුදුසුකම් :…………………………………………………………………………………………………

10. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශකර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත්වන බවත්, මම දනිමි.

………………………,
අයදුම්කරුගේ අත්සන.

දිනය :……………………………

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ………………………………(ලිපිනය) හි පදිංචි ……………………………………… (නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :……………………………

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :……………………………………………………
තනතුර :……………………………………………………
ලිපිනය:……………………………………………………

12. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.

මෙම ඉල්ලුම්කරුවන් ……………………………………………(නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ……………………………………………(තනතුර) වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

………………………………,
අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :…………………

06-95

# පළාත් පාලන නිවේදන

## අනුරාධපුර මහා නගර සභාව

### අනුරාධපුර මහා නගර සභාවේ අවසරයකින් තොරව රථගාල් පවත්වාගෙන යාම තහනම් කිරීම

මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 4 වන වගන්තිය ප්‍රකාරව හා 1252 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ පවතින විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයේ දැක්වෙන මායිම් සහිත භූමිය පූරවර උද්‍යානය විශේෂ කලාපය ලෙස නම්කර 2026 ජූනි මස 29 වන දින සිට 2026 ජූලි මස 11 වන දින දක්වා කාලය තුළ මහානගර සභාවේ විධිමත් අවසරයකින් තොරව පහත සඳහන් භූමි කලාපය තුළ පොදු රථගාල් පවත්වාගෙන යාම තහනම් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

*උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුරාධපුර මහා නගර සභා සීමාව තුළ*

| | | |
|---|---|---|
| උතුරට | : | ශ්‍රී මහා බෝධි මාවත, දුම්රිය නගරයේ සිට පොදු වෙළඳසැල් සංකීර්ණය දක්වා මායිම් තුළ මාර්ග, මාර්ග දෙපස හා භූමි භාගයන් වේ. |
| නැගෙනහිරට | : | පොදු වෙළඳසැල් සංකීර්ණය, ධර්මපාල මාවත, ආයුර්වේද වටරවුම දක්වා මායිම් තුළ මාර්ග, මාර්ග දෙපස හා භූමි භාගයන් වේ. |
| දකුණට | : | ආයුර්වේද වට රවුම, පොලිස් වටරවුම, බුද්ධ ජයන්ති වටරවුම දක්වා මායිම් තුළ මාර්ග, මාර්ග දෙපස හා භූමි භාගයන් වේ. |
| බටහිරට | : | ජයන්ති වටරවුම සිට සිංහ කණුව වටරවුම දක්වා මායිම් තුළ මාර්ග, මාර්ග දෙපස හා භූමි භාගයන් වේ. |

නවරත්නරාජා කරුණාරත්න,
නගරාධිපති.

06-114/1

---

## අනුරාධපුර මහා නගර සභාව

### පූරවර උද්‍යානය ආදායම් උත්පාදන වැඩසටහන හා සැණකෙළිය පැවැත්වෙන කලාපය තුළ වෙළඳ අයිතිය බදු දීම තහනම් කිරීම

මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 4 වන වගන්තිය ප්‍රකාරව හා 1252 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ පවතින විධිවිධාන පරිදි මහා නගර සභාවේ විධිමත් අවසරයකින් තොරව පහත උපලේඛනයේ දැක්වෙන මායිම් තුළ පූරවර උද්‍යානය විශේෂ කලාපය ලෙස නම්කර එකී කලාපය 2026 ජූනි මස 29 දින සිට 2026 ජූලි මස 11 දින දක්වා කාල සීමාව තුළ වෙළඳ අයිතිය බදු දීම තහනම් කරන බව මෙයින් නිවේදනය කරමි.

*උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුරාධපුර මහා නගර සභා සීමාව තුළ;*

| | | |
|---|---|---|
| උතුරට | : | ශ්‍රී මහා බෝධි මාවත, දුම්රිය නගරයේ සිට පොදු වෙළඳසැල් සංකීර්ණය දක්වා මායිම් තුළ මාර්ග, මාර්ග දෙපස හා භූමි භාගයන් වේ. |
| නැගෙනහිරට | : | පොදු වෙළඳසැල් සංකීර්ණය, ධර්මපාල මාවත, ආයුර්වේද වටරවුම දක්වා මායිම් තුළ මාර්ග, මාර්ග දෙපස හා භූමි භාගයන් වේ. |
| දකුණට | : | ආයුර්වේද වට රවුම, පොලිස් වටරවුම, බුද්ධ ජයන්ති වටරවුම දක්වා මායිම් තුළ මාර්ග, මාර්ග දෙපස හා භූමි භාගයන් වේ. |
| බටහිරට | : | ජයන්ති වටරවුම සිට සිංහ කණුව වටරවුම දක්වා මායිම් තුළ මාර්ග, මාර්ග දෙපස හා භූමි භාගයන් වේ. |

06-114/2

**මඩකලපුව මහ නගර සභාව**

පහත සඳහන් ස්ථාන "චතුරස්‍ර" ලෙස නම් කිරීම පිළිබඳ නිවේදනය

1947 අංක 29 දරන මහනගර සභා ආඥාපනතේ 71 වැනි වගන්තිය ප්‍රකාරව, මඩකලපුව මහ නගර සභා සීමාව ඇතුළත පිහිටි පහත දැක්වෙන උපලේඛනයට අනුව පහත සඳහන් ස්ථාන, චතුරශ්‍ර ලෙස නම් කිරීමට 2026.04.09 සහ 2026.05.07 යන දිනවල පැවැත්වුණු සභා රැස්වීම්වලදී අංක BMC/GM14(12)/2026-02 සහ BMC/GM15(13)/2026-02 දරන යෝජනා සම්මතයන් මගින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

01. වාවික්කරයි පාර 1 හි පිහිටි තන්තෙසෙල්වා මහතාගේ ප්‍රතිමාව පිහිටි ස්ථානය "තන්තෙසෙල්වා චතුරස්‍රය" ලෙස නම් කිරීම.

02. කල්ලඩි පාළම අසල පිහිටි අඩි 16 ක් උසැති සුවාමි විපුලානන්දා ප්‍රතිමාව පිහිටි ස්ථානය "සුවාමි විපුලානන්දා චතුරස්‍රය"ලෙස නම් කිරීම.

සිවම් පාක්කියනාදන්,
මහනගරාධිපති,

මහ නගරසභාව,
මඩකලපුව.

06-126

---

**නාඋල ප්‍රාදේශීය සභාව**

ත්‍රී රෝද රථ නැවතුම් ස්ථාන පිළිබඳ නිවේදනය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු 261 අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.03 දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV(අ) කොටසේ පළ කරනු ලැබූ සම්මත පොදු අතුරු ව්‍යවස්ථාව නාඋල ප්‍රාදේශීය සභාව විසින් වැළඳ ගන්නා බව 2017.11.17 දින අංක 2046 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇත.

ඒ අනුව, එකී සම්මත පොදු අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 4(III) උපවගන්තිය යටතේ පත් කරන ලද රථ වාහන කමිටුව විසින් නිර්දේශ කර ඇති පහත උපලේඛනයේ පළමු තීරයේ සඳහන් අනු අංක සහ දෙවන තීරයේ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රී රෝද රථ නැවතුම් ස්ථාන ලෙස හඳුනා ගත් ප්‍රදේශවල නාමයන් සහ තුන්වන තීරයේ සඳහන් මුල් අවසර ලත් ත්‍රී රෝද රථ සංඛ්‍යාවෙන් එක වරකට නවතා තැබිය හැකි ස්ථානවල උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව නැවැත්වීමට, අවසර ලබා දෙන බව මෙයින් නිවේදනය කරමි.

පී. ජී. සුනිල් ශාන්ත,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2026 අප්‍රේල් මස 09 දින,
නාඋල ප්‍රාදේශීය සභාව,
නාඋල.

උපලේඛනය

| අනු අංකය | අනුමත ත්‍රී රෝද රථ නැවතුම් ස්ථානය | මුල් අවසර ලත් ත්‍රී රෝද රථ සංඛ්‍යාවෙන් එක් වරකට නවතා තැබිය හැකි උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | උඩුදෙණිය හන්දිය ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 03 |
| 02 | නාලන්ද රෝහල ඉදිරිපිට ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 03 |
| 03 | හුංගන්වෙල හන්දිය ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 06 |
| 04 | මීගොල්ල හන්දිය ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 03 |
| 05 | අරංගල පොලිසිය අසල ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 04 |
| 06 | බෝවතැන්නහන්දිය ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 04 |
| 07 | නාඋල ලක්රුක ඉන්ධන පිරවුම්හල අසලත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 03 |
| 08 | නාඋල බස් නැවතුම්පොළ අසල ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 07 |
| 09 | නාඋල අම්බලම අසල ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 05 |
| 10 | කරවිලහේන හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 03 |
| 11 | නාඋල බිබිල හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 03 |
| 12 | බොබැල්ල සී. ඩී. හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 03 |
| 13 | නාඋල ඔරලෝසු කණුව අසල ඇලහැර හන්දිය ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 06 |
| 14 | අඹන හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 03 |
| 15 | කෝන්ගහවෙල වයි හන්දිය හෙළ බොජුන් හල අසල ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 03 |
| 16 | අඹන පාළම අසල ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානය | 04 |

06-111

---

## ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

### ආණමඩුව ප්‍රාදේශීය සභාව

මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 වන නීරයේ විධිවිධානවලට අනුකූල වන පරිදි පහත උපලේඛනවල සඳහන් විගණනය කරන ලද ආණමඩුව ප්‍රාදේශීය සභාවේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, 2025.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ 2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

ඩී. එම්. ඒ. කේ. එම්. ආලෝක බණ්ඩාර,
සභාපති,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2026 මැයි මස 15 දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛන අංක I**

**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

**2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය**

| | සටහන් | 2025.12.31 | 2024.12.31 |
|---|---|---|---|
| | | රු. ශත | රු. ශත |
| **මෙහෙයුම් අයභාරය** | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 1 | 94,647,674.15 | 72,125,785.85 |
| වෙනත් අයභාරය | 2 | 82,646,882.07 | 77,882,707.39 |
| මුලු මෙහෙයුම් අයභාරය | | 177,294,556.22 | 150,008,493.24 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුනරාවර්තන වියදම | 3 | 159,128,131.04 | 120,911,707.68 |
| මුලු මෙහෙයුම් වියදම | | 159,128,131.04 | 120,911,707.68 |
| වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/(ඌනතාවය) | | 18,166,425.18 | 29,096,785.56 |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | 30,237,226.47 | 17,558,567.51 |
| ප්‍රාග්ධන වියදම් | 5 | 57,077,921.30 | 23,360,015.69 |
| වර්ෂය සඳහා වන අතිරික්තය/ (ඌනතාවය) | | (8,674,269.65) | 23,295,337.38 |

**උපලේඛන අංක 2**

**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

**2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2025.12.31 | 2024.12.31 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ ඌනතාවය | 18,166,425.18 | 29,096,785.56 |
| මුදල් නොවූ සිදුවීම් සඳහා ගැලපීම් | | |
| ක්ෂය වීම් | - | - |
| පාරිතෝෂිත වෙන් කිරීම් | - | - |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | 4,669,351.26 | 15,464,127.46 |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ ඌනතාවය | 22,835,776.44 | 44,560,913.02 |
| තොග ණයගැතියන්/අනෙකුත් ලැබීම් (වැඩිවීම්) අඩු වීම් | (3,155,735.60) | (25,632,176.08) |
| ණය හිමියන් ගෙවිය යුතු දෑ වැඩි වීම (අඩු වීම) | 60,508,426.98 | 1,129,018.18 |

| | 2025.12.31 | 2024.12.31 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 80,188,467.82 | 20,057,755.12 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර තැන්පතු | (21,759,273.49) | (6,297,112.40) |
| සේවක ඇප තැන්පතු | (18,794,58) | 24,635.24 |
| ප්‍රාග්ධන වියදම් | (57,077,921.30) | (23,360,015.69) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (78,855,989.37) | (29,632,492.85) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ලැබීම් | 30,237,226.47 | 17,558,567.51 |
| දේශීය ණය ගෙවීම්/ණය ප්‍රතිව්‍යුහගත කිරීම් | (822,368.87) | (770,750.28) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 29,414,857.60 | 16,787,817.23 |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් | 30,747,336.05 | 7,213,079.50 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | 12,665,287.57 | 5,452,208.07 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | 43,412,623.62 | 12,665,287.57 |
| **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව - පොදු ගිණුම - 0003860052 | 35,683,763.91 | 8,169,625.80 |
| ලංකා බැංකුව - ව්‍යාපෘති ගිණුම - 0009930549 | 3,065,918.92 | 2,538,381.92 |
| ලංකා බැංකුව - කර්මාන්ත ගිණුම - 0003860075 | 3,241,553.87 | 1,509,879.99 |
| ලංකා බැංකුව - සේවක ණය ගිණුම - 00038660283 | 1,421,386.92 | 447,399.86 |
| | **43,412,623.62** | **12,665,287.57** |

**උපලේඛන අංක 3**

**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

**2025.12.31** දිනට

**මූල්‍ය තත්ව ප්‍රකාශය**

| | සටහන් | 2025.12.31<br>රු. ශත | 2024.12.31<br>රු. ශත |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 6 | 254,196,410.88 | 234,826,524.27 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 7 | 7,679,863.80 | 5,744,255.71 |

| | *සටහන්* | *2025.12.31*<br>*රු. ශත* | *2024.12.31*<br>*රු. ශත* |
|---|---|---|---|
| ලැබිය යුතු දෑ | 8 | 70,203,670.12 | 70,687,868.48 |
| සේවක ණය හා අත්තිකාරම් | 9 | 12,279,650.52 | 10,575,324.65 |
| ආයෝජන | 10 | 50,222,197.05 | 28,444,128.98 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 43,412,623.62 | 12,665,287.57 |
| **මුලු වත්කම්** | | **437,994,415.99** | **362,943,389.66** |
| **හිමිකම්** | **12** | **358,602,879.45** | **343,237,911.23** |
| **වගකීම්** | | | |
| ජංගම නොවන වගකීම් | 13 | - | - |
| ජංගම වගකීම් | 14 | 79,391,536.54 | 19,705,478.43 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **437,994,415.99** | **362,943,389.66** |

06-109

---

# විවිධ දැන්වීම්

## නාවලපිටිය නගර සභාව

ආදාහනාගාර ගාස්තු සංශෝධනය

2025.12.26 දින හා අංක 2,469 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආදාහනාගාර ගාස්තු දැන්වීම සහා තීරණ අංක 04-අ-IV යටතේ පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**සංශෝධිත ආදාහනාගාර වටිනාකම් :**

| 03 | *ආදාහනාගාර ගාස්තු :* | *රු. ශත* |
|---|---|---|
| i | නගර සීමාව තුළ පදිංචි | 13,000.00 |
| ii | නගර සීමාවෙන් පිටත පදිංචි | 20,000.00 |
| ***** | (ප.ව. 6.00ට පසුව ආදාහනය සඳහා අමතර ගාස්තුව) | 1,000.00 |

ජී. බී. අමල් ප්‍රියංකර,
සභාපති,
නාවලපිටිය නගර සභාව.

2026 මැයි මස 14 දින,
නාවලපිටිය නගර සභාවේ දී ය.

06-232

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**

2026 වාර්ෂික සේවා ගාස්තු පැනවීම

2019.12.05 දිනැති අංක 2152/48 දරන *ගැසට් පත්‍රය* මගින් පනවා ඇති ගල්වලවල් හා ගල් ඇඹරුම්හල් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 10 වැනි වගන්තිය යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2026 වර්ෂයේ මැයි මස 18 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 06 (12) යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෛද්‍ය ඩබ්. වසන්ත කුමාරසිරි,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.

2026 මැයි මස 26 දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

2019.12.05 දිනැති අංක 2152/48 දරන *ගැසට් පත්‍රය* මගින් පනවා ඇති ගල්වලවල් හා ගල් ඇඹරුම්හල් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 10 වැනි වගන්තිය යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ගල්වලවල් හා ගල් ඇඹරුම්හල් හේතුවෙන් ප්‍රාදේශීය සභා මාර්ගයකට හෝ වෙනත් කවර හෝ දේපළකට සිදුවන හානි වළක්වා ගැනීම වෙනුවෙන් පහත සඳහන් අංක 01 උපලේඛනය පරිදි සේවා ගාස්තුවක් 2026 වර්ෂයට පනවා අය කිරීම සුදුසු බවට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

**උපලේඛනය - අංක 01**

| | *ස්ථාවර ගාස්තු රු. ශත* | *ප්‍රවාහන ගාස්තුව* |
|---|---|---|
| සුළු පරිමාණ | 5,000.00 | කියුබ් 1 ක් ප්‍රවාහනය සඳහා රු. 100.00 ක් අය කරනු ලබයි |
| මධ්‍යම පරිමාණ | 10,000.00 | කියුබ් 1 ක් ප්‍රවාහනය සඳහා රු. 100.00 ක් අය කරනු ලබයි |
| මහ පරිමාණ | 20,000.00 | කියුබ් 1 ක් ප්‍රවාහනය සඳහා රු. 100.00 ක් අය කරනු ලබයි |

06-98

---

**කුරුණෑගල මහා නගර සභාව**

කුරුණෑගල මහා නගර සභාව තුල 2026 වර්ෂය සඳහා ආදායම් උත්පාදනයන් පහත පරිදි වේ -

කුරුණෑගල මහා නගර සභාව විසින් 2026.03.16 දින පවත්වන ලද මහ සභා සම්මුමති අංක GC/06/10/2026/03/16/MCK/HD/08 යටතේ 2026.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන යෝජනාව මගින් අවමංගල්‍යා ශාලා ගාස්තු අය කිරීම සංශෝධනය කිරීමේ යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආනන්ද ඇන්ටන් සහබන්දු,
නගරාධිපති,
කුරුණෑගල මහා නගර සභාව.

2026 මැයි මස 29 දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**1. අවමංගල්‍ය ශාලා ගාස්තු අය කිරීම :**

**ලෝකඩ පැකේජය**

| *අනු. අංකය* | *පැය ගණන* | *නගර සීමාව තුළ (රු.) + වැට් බදු රු. ශත* | *නගර සීමාවෙන් පිටත (රු.) + වැට් බදු රු. ශත* |
|---|---|---|---|
| 1 | පැය 24 | 25,000.00 | 30,000.00 |
| 2 | පැය 12 | 15.000.00 | 20,000.00 |
| 3 | පැය 5ට අඩු | 10,000.00 | 10,000.00 |

**රිදී පැකේජය**

| *අනු. අංකය* | *පැය ගණන* | *නගර සීමාව තුළ (රු.) + වැට් බදු රු. ශත* | *නගර සීමාවෙන් පිටත (රු.) + වැට් බදු රු. ශත* |
|---|---|---|---|
| 1 | පැය 24 | 30,000.00 | 35,000.00 |
| 2 | පැය 12 | 20,000.00 | 25,000.00 |
| 3 | පැය 5ට අඩු | 15,000.00 | 15,000.00 |

**රන් පැකේජය**

| *අනු. අංකය* | *පැය ගණන* | *නගර සීමාව තුළ (රු.) + වැට් බදු රු. ශත* | *නගර සීමාවෙන් පිටත (රු.) + වැට් බදු රු. ශත* |
|---|---|---|---|
| 1 | පැය 24 | 60,000.00 | 65,000.00 |
| 2 | පැය 12 | 30,000.00 | 35,000.00 |
| 3 | පැය 5ට අඩු | 20,000.00 | 20,000.00 |

ආගමික වතාවත් සඳහා එක් එක් පැකේජය යටතේ ඇති පැය 0ට අඩු ගාස්තුව අය කෙරේ.

06-94

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.